# MANRECAP මාසික පුවත් නිවේදනය #20

| සැප්තැම්බර් 2007 සිට දෙසැම්බර් 2007 | # 20 |
|---|---|

## 1 : පුනරුත්ථාපනය කළ යටිතල පහසුකම් වල ක්‍රියාකාරිත්වය සහ නඩත්තු ගැන පුනරීක්ෂණ චාරිකා

වාරියපොල ප්‍රදේශයේ ග්‍රාමීය දරිද්‍රතාවය අවම කරගැනීම උදෙසා යටිතල පහසුකම් නඩත්තුව සඳහා ව්‍යාප්තිය සඳහා වූ නිරීක්ෂණ චාරිකාවක් සැප්තැම්බර් මස 5 සහ 6 යන දිනවල ප්‍රදේශීය සභා නගර සභා නියෝජිතයන් ද CBO නියෝජිතවරුන් ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

මේ නිරීක්ෂණ චාරිකාවේ මුලික පරමාර්ථය වුයේ යටිතල හා සේවා පහසුකම් වල නඩත්තු ක්‍රියාකාරිත්වය සහ සේවයට යෙදවීම සම්බන්ධයෙන් CBO නියෝජිත මහතුන්ට ඒ ගැන මනා වැටහීමක් ද අවබෝධයක් ද ඒ වාගේම ඔවුන් සමග එක් වී වැඩ කරන මැන්රිකැප් ආයතනයට ද ඒ ගැන වගකිවයුතු වේ" මේ නිරීක්ෂණ චාරිකාවට සහභාගීවූවන්ට කුඩා වාරිමාර්ග පද්ධති වලින් ජලය සැපයෙන පිටිසර ගම්මානණී කුඩා ප්‍රජා ජලසම්පාදන සැලසුම් ක්‍රියාත්මක වන ප්‍රදේශ සහ CBO සංවිධාන වලින් පාලනය කෙරෙන කුඩා මංමාවත් ඇති ප්‍රදේශවලට ගොස් ඒවා නැරැඹීමට අවස්ථාවක් උදාකර ගන්නා ලදී. එමෙන්ම ඔවුනට ප්‍රදේශයේ යටිතල හා සේවා පහසුකම් වල නඩත්තු ක්‍රම ගැන විස්තර සහිත අවබෝධයක් ලබාගත හැකි විය. ඔවුනට මනාව අවබෝධ වී ගියේ ප්‍රජාවට සාර්ථක ලෙස ක්‍රම සහ විධි ක්‍රියාත්මක කිරීමේදී ඒ ප්‍රජාවට ඒවායේ අයිතිය ගැන හැඟීමක් සහ ඒ ගැන ආඩම්බරයක් ද ඇතිවිය යුතුය. එමෙන්ම ඒ ප්‍රදේශයේ ප්‍රජාව සහ රාජ්‍ය නිලධාරීන් අතර සුහද සම්බන්ධතාවයක් සහ හොඳ වැටහීමක් තිබිය යුතුය.

මේ අධ්‍යයන නිරීක්ෂණයෙන් අනතුරුව සැප්තැම්බර් මාසයේ අග භාගයේ දී රාජ්‍ය නිලධාරීන් ද CBO නියොජිතයින්ද වාරියපොල අධ්‍යයන නිරීක්ෂණයට සම්බන්ධ වු සියලු දෙනා ද එක් කොට සමීක්ෂණයක් පවත්වන ලදී. මේ රැස්වීමේදී සියලු පාර්ශව වල නියෝජිතයන්ගේ එකඟත්වයෙන් වාරිය පොල වැඩමුලුවේදී ක්‍රියාත්මක කල ක්‍රමවේදය ක්‍රියාවට යෙදවීමට තීරණය විය.





## 2 : අවසාන ප්‍රගති සමාලෝචනය

ජයිකා ආයතනයේ සාමාජිකයන් ද ජාතිය ගොඩ නැගීමේ අමාත්‍යාංශයේ නිලධාරීන් ද ඇතුළු ඒකාබද්ධ ඇගැයීම් කමිටුව මේ ව්‍යාපෘතිය නිරීක්ෂණයට ගොස් ඒ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයක් සහ අනෙකුත් කටයුතු 2007 ඔක්තෝම්බර් මස 6 වන දින සිට 23 දින දක්වා අධික්ෂණය කරන ලදී.

ඒ ඇගැයීම් කණ්ඩායමේ තීරණය වුයේ මේ ව්‍යාපෘතියේ කාර්යයන් මුලුමනින්ම වාගේ සාර්ථකව නිමවී ඇති බවත් එමෙන්ම ඒ ඉලක්ක ගම්මාන වල ජීවත් වන ප්‍රජාව ප්‍රජා ක්‍රියාකාරී සැලසුම ව්‍යාපෘති කාර්යයේ ප්‍රධාන තීරකය වශයෙන් පිළිගෙන ඇත.







## 3 : ශාන්ති පුරම් ප්‍රදේශයේ ප්‍රජා ජලසම්පාදන ක්‍රමයට ජල නල ජාලය එලීම

පසුගිය දශක දෙකක කාල සීමාව තුල ශාන්තිපුරම් ජල සම්පාදන ක්‍රමයට ජල නල ජාලය දැමීම දිනෙන් දිනම කල් පසුවී ගියත් මේ ජාලය දැමීම ශාන්තිපුරම් ප්‍රදේශයේ අත්‍යාවශ්‍යම ව්‍යාපෘතියක් වශයෙන් සලකන ලදී. මෙය ජාතික ජල සම්පාදන සහ ජල ප්‍රවාහන මණ්ඩලයට අයත් කාර්යයක් වුවත් එයට අවශ්‍ය මුදල් නොමැති වීමත් එමෙන්ම ටෙන්ඩර් පරිපාටියේ ඇතිවූ අඩුපාඩු නිසාත් මෙය දිනෙන් දිනම අතපසු විය. ප්‍රදේශයේ ආරක්ෂක තත්වය පිරිහී යෑම නිසා මේ කාර්යයට කිසිම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් නොවූ නිසා මෙය ක්‍රියාත්මක නොහැකි විය.

කරුණු මෙසේ වූ හෙයින් මැනිරිකැප් ආයතනය ශාන්තිපුරම් ප්‍රදේශයේ ප්‍රජා ජල සම්පාදන ක්‍රමය එහි ප්‍රජා සංවිධාන වල සහභාගීත්වය ඇතිව ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ සහයෝගය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන ලදී. ජාතික ජල සම්පාදන මණ්ඩලය මෙවැනි කාර්යයක් ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන වලට පැවරූ මුල් ම අවස්ථාව මෙය විය. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මෙවැනි තීරණණයක් ගත්තේ ශාන්තිපුරම් ප්‍රදේශයේ ප්‍රජා මූලික සංවිධාන සහ මැන්රිකැප් ආයතනය කෙරෙහි තිබූ විශ්වාසය නිසාය.

මෙහි වැඩ කටයුතු ඉතාම සුලු කාල සීමාවක් තුලදී නිමාවට පත්වූ අතර ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය ඒ වැඩ කටයුතුවල ගුණාත්මක භාවය ගැන සතුට පල කරන ලදී. මේ හේතුවෙන් ජල සම්පාදන මණ්ඩලය මේ ප්‍රජා සංවිධාන වලට තවත් වැඩ කොටසක් පවරණ ලදී. එනම් ජල සම්පාදන මණ්ඩලයෙහි ඇති ඔවර්හෙඩ් ටැංකියට කිලෝමීටර් 4.1 පමණ දුරකට ජල නල එලීම ජල සැපයුම් මාර්ගයක් සකස් කර ගැනීමයි. මෙය කැලෑ

ආශ්‍රිත ප්‍රදේශ සහ නගර මැදින් වැටී තිබුණත් ඉතාම සුලු කාලයකදී එයද සාර්ථක අන්දමින් නිම කරන ලදී.



ජල සම්පාදන යෝජනා ක්‍රමයට සහභාගී වූ ජනතාව

## 4 : ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් නිරීක්ෂණ වැඩ මුලුව

2007 නොවැම්බර් මස 26 ව දින ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් නිරීක්ෂණ වැඩමුලුව පවත්වන ලදී. එය සහභාගී වුවත් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වීමත් ප්‍රජා සහභාගීත්වය මෙන්ම ස්වයං රැකියා සඳහා මුදල් අවශ්‍ය බිත්තර වී ලබා ගැනීම මෙන්ම දැනට ගොඩ නගා ඇති සේවා පහසුකම් සඳහා ගොඩනැගිලි නියම අන්දමින් ප්‍රයෝජනයට ගැනීම නඩත්තු කිරීම වැනි දේවල් ගැන මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි වීමක්ය.

සමස්තයක් වශයෙන් ගෙන බැලුවිට ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් ගැන වැඩ මුලු සකස් කර ගත්තේ කෙසේ ද? ඒවායේ සහභාගීත්වය සහ ඒවායේ තීරණ ගත යුත්තේ කෙසේ ද? ගමේ සංවර්ධන වැඩ කටයුතු සඳහා ඒවා කෙසේ උපයෝගී කර ගත යුතුද යන්න ගැන දැන් හොඳ අවබෝධයක් ගම්මුන් ලබා ඇත.



පුත්තුකමාම් වල ප්‍රජා ක්‍රියාකාරී වැඩ මුලුව



ශාන්තිපුරම් වල ප්‍රජා ක්‍රියාකාරී වැඩ මුලුව

## 5 : පුත්තුකමාම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පුනරුත්තාපන කළ යටිතල පහසුකම් පවරා දීම

2007 නොවැම්බර් මස 27 වන දින පුත්තුකමාම් සමය පුරම් වඩ්ඩුපිත්තන් මාඩු සහ තෙන්නවාඩි මුරුදන්කුලම් යන ප්‍රදේශවල යටිතල හා සේවා පහසුකම් නිල වශයෙන් මන්නාරම් ප්‍රාදේශීය ලේකම් තුමා වෙත පවරා දෙනු ලැබීය. අනතුරුව ඔහු ඒ යටිතල සහ සේවා පහසුකම් ඒ ඒ ප්‍රජා සංවිධාන වලට ඒවා නිසි ආකාරයට ප්‍රයෝජන ගැනීමට සහ නඩත්තු කිරීමට බාර දෙන ලදී. ඒවා අතර පෙර පාසලක්, ප්‍රජා ජල සම්පාදන ක්‍රමයක්, ගම්වල අභ්‍යන්තර මං මාවත් විවිධ කාෘයයන් සඳහා වූ ශාලාවක් ද ප්‍රජා ශාලාවක් ද මේ අතර විය.



